# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2086/33 - 2018 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2(2) උපවගන්තිය යටතේ විශේෂ ආඥාවක් අනුව සිදු කරන බලය පැවරීම.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2(2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් සභාවේ සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය පියසිරි රාමනායක වන මම වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහාය වීමට පත්කර ඇත්තා වූ මිට අමුණා ඇති උපලේඛනයේ I තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III තීරුවෙහි සඳහන් සියළුම බලතල එකී උපලේඛනයේ II තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

පියසිරි රාමනායක,
සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, ඉඩම්, විදුලිබල හා
බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික
හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය.

කුරුණෑගල දී ය.


1A – PG 4194 – 08 (2018/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| සේසත්පුර දේවගේ ෂෙල්ටන් ලීලාරත්න. | 2018.07.16 | සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 44, [44(6), 45, 46, 48, 49, 50, 52, 53, 54, 58 [58(3) සහ 58 (5) හැර] 59, 68 සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල රීති මාලාවේ 4, 11, 15, 16(II) 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 [49(XII) හැර] 51, 52, සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල. |

09 - 364

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.